**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 1617/ 2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023
දිනය / திகதி / Date — 24/12/2023 පැය 1320

# මාධ්‍ය නිවේදනය

**යුක්තිය දින තුනකට නවතී යනුවන් මාධ්‍ය මඟින් ප්‍රචාරය වන කරුණ සම්බන්ධව - පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

2023.12.17 වන දින සිට 2023.12.23 වන දින දක්වා ශ්‍රී ලංකා පොලිසිය මඟින් ක්‍රියාත්මක කරන ලද යුක්තිය මෙහෙයුම නත්තල් උත්සවය වෙනුවෙන් දින 03කට නතර කර ඇති බවට විවිධ මාධ්‍ය මඟින් ප්‍රචාරය වී ඇත. නමුත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කරනු ලැබුවේ එය සම්පූර්ණයෙන් නතර නොකරන බවත්, කිතුණු බැතිමතුන්ගේ ආගමික කටයුතු වලට ප්‍රමුඛතාවය ලබා දීමත් සති අන්ත දීර්ඝ නිවාඩුවත් වර්ෂ අවසාන උත්සව සමය වෙනුවෙන් ආරක්ෂාව ලබා දීම සඳහා විශාල පොලිස් නිලධාරීන් සංඛ්‍යාවක් හා  පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් සංඛ්‍යාවක් යෙදවීම හේතුවෙන් මෙම මෙහෙයුම සඳහා යොදවනු ලබන නිලධාරීන් කණ්ඩායම් යම්කිසි ප්‍රමාණයකින් අඩු වන බවයි.

නමුත් යුක්තිය මෙහෙයුම අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර විශේෂයෙන්ම මහජනතාවට තොරතුරු ලබා දීම සඳහා මේ වන විට හඳුන්වා දී ඇති දුරකථන අංක 46ට අදාලව ලැබෙන තොරතුරු පිළිබඳව ඉදිරි දින වලද ඒ ආකාරයෙන්ම මෙහෙයුම ක්‍රියාත්මක වේ. මහජනතාවට  විෂ මත්ද්‍රව්‍ය පිළිබඳ  අදාල තොරතුරු පෙර පරිදිම නොකඩවා ලබා දියහැකි බවට අවධාරණය කරමි. මහජනතාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් පොලිස් ස්ථාන මට්ටමින් ක්‍රියාත්මක කරන  සාමාන්‍ය මෙහෙයුම් හා වැටලීම්ද  පවත්වාගෙන යාමට කටයුතු කෙරෙනු  ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**